# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No. DMS/Salary Revision/ 2025 – I

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025.04. 08

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

පාර්ලිමේන්තු මහ ලේකම්

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**<u>රාජ්‍ය අංශයේ වැටුප් සංශෝධන - 2025</u>**

ඉහත මැයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක 25/0516/804/064 හා 2025.03.24 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2025.03.24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලැබී ඇති අනුමැතිය අනුව පහත සඳහන් වැටුප් චක්‍රලේඛ නිකුත් කර ඇත.

| අනු අංකය | චක්‍රලේඛ අංකය | චක්‍රලේඛය නිකුත් කරන ලද දිනය | චක්‍රලේඛයෙහි අන්තර්ගතය |
|---|---|---|---|
| 01. | 01/2025 | 25.03.2025 | රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්යමණ්ඩලය සඳහා වන වැටුප් සංශෝධනය - 2025 |
| 02. | 02/2025 | 25.03.2025 | අග්‍රවිනිශ්චයකාරවරයා සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් සඳහා වන වැටුප් සංශෝධනය - 2025 |
| 03. | 03/2025 | 25.03.2025 | මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ ශ්‍රී ලංකා අධිකරණ සේවයේ නිලධරයන් සඳහා වන වැටුප් සංශෝධනය - 2025 |
| 04. | 04/2025 | 25.03.2025 | පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා වන වැටුප් සංශෝධනය - 2025 |
| 05. | 05/2025 | 25.03.2025 | ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවා පුද්ගලයින් සඳහා වන වැටුප් සංශෝධනය - 2025 |
| 06. | 06/2025 | 25.03.2025 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යමණ්ඩලය සහ විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල සඳහා වන වැටුප් සංශෝධනය - 2025 |
| 07. | 07/2025 | 27.03.2025 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් කාර්ය මණ්ඩලය සඳහා වන වැටුප් සංශෝධනය - 2025 |
| 08. | 08/2025 | 27.03.2025 | විජය කුමාරතුංග අනුස්මරණ රෝහල් කාර්ය මණ්ඩලය සඳහා වන වැටුප් සංශෝධනය - 2025 |

2. ඉහත සඳහන් චක්‍රලේඛ වලට අනුකූලව අප්‍රේල් මස වැටුප් දිනය වන 2025.04.10 වන විට වැටුප් පරිවර්තනය සිදු කිරීමට අපොහොසත් වන ආයතන පහත සඳහන් පරිදි කටයුතු කළ යුතු බවට ද අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත.

අ) පැරණි වැටුප් පරිමාණ යටතේ තම නිලධාරීන්ට හිමි වැටුප 2025.04.10 දින ගෙවීම.

ආ) නව වැටුප් චක්‍රලේඛ අනුව වැටුප් පරිවර්තනයන් සිදු කිරීමෙන් අනතුරුව අප්‍රේල් මාසය සඳහා ගෙවිය යුතු වැටුපෙහි හිඟ මුදල 2025.04.25 වන දිනට ගෙවීම.

3. ඒ අනුව, 2025.04.10 දින වන විට වැටුප් පරිවර්තනය සිදු කිරීමට අපොහොසත් වන ආයතන සම්බන්ධයෙන් උක්ත පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

කේ.එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව